# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1944/52 - 2015 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා - 2015.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/07/06/2010.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.09.16 දිනැති හා අංක 1723/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.09.12 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 03, ඇලෝයි මාවත, අංක 06හි පදිංචි ලංකා වතු සේවා සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කහදූව, රැකඩහේන හි පිහිටි රැකඩහේන වැවිලි (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.09.21 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය :* IR/07/06/2010.

**කාර්මික අධිකරණයේ දී ය.**

ලංකා වතු සේවා සංගමය,
අංක 06, ඇලෝයි මාවත,
කොළඹ 03.

හා

නඩු අංකය : ඒ 3402

රැකඩහේන වැවිලි (පුද්ගලික) සමාගම,
රැකඩහේන,
කහදූව,

අතර වූ කාර්මික ආරාවුල

**ප්‍රදානයයි**

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත යන පනත්වලින් සංශෝධිත වූ ලංකා ව්‍යාවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් කම්කරු අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ලංකා වතු සේවා සංගමය හා රැකඩහේන වැවිලි (පුද්ගලික) සමාගම අතර පැවති කාර්මික ආරවුල කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා 2011.09.12 දතමින් මාවෙත යොමු කරන ලදී.

මෙම කාර්මික ආරවුලට කරුණු දෙකක් පදනම් වී ඇත.

1. රැකඩහේන වැවිලි (පුද්ගලික) සමාගමේ කාර්ය මණ්ඩල සේවකයින් වශයෙන් සේවය කරනු ලබන ලංකා වතු සේවා සංගමයේ සාමාජිකත්වය දරන සේවකයින් සඳහා ක්‍රියාත්මකව පැවති වෛද්‍යාධාර ක්‍රමය අහෝසි කිරීමෙන් එම සේවකයින් භුක්ති විඳින වරප්‍රසාද අහිමි වූයේ ද ? එසේ නම් ඔවුනට හිමි විය යුතු සහන මොනවාද ?

2. රැකඩහේන වැවිලි (පුද්ගලික) සමාගමේ තේ කම්හලේ සහ වතුයායේ සේවයේ නියුතු කාර්ය මණ්ඩල සේවකයින්ට ලබා දෙන වැටුප් හා දීමනාවලට වඩා වෙනස් වූ වැටුප් එම කම්හලේ සහකාර කම්හල් නිලධාරී තනතුරට අයත් රාජකාරී කටයුතුවල සේවයේ යොදව ඇති පී. ඒ. එස්. කුමාර, අජිත් නිශාන්ත විතානාච්චි හා තුෂාර වන්නිආරච්චි යන සේවකයින්ට ලබාදීමෙන් හා 2009

1 A – G 22690— 18 (2015/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වර්ෂයේ සිට කාර්ය මණ්ඩලයේ කිහිපදෙනෙකුට පමණක් ප්‍රසාද දීමනා ලබා නොදීමෙන් ඔවුනට යම් ආසාධාරණයක් සිදුවී ඇද්ද ? එසේ නම් ඔවුනට ලැබිය යුතු සහන මොනවාද හා කුමන ප්‍රමාණයකින් ද ?

ඉල්ලුම්කාර ලංකා වතුසේවා (පුද්) සමාගමේ සාමාජිකයින් වන ඒ. වී. ආදිහෙට්ටි, ඒ. ඒ. සරත් කුමාර හා එම්. ඩබ්ලිව්. කේ. රංජිත් සුමනසිරි සාක්ෂි සඳහා කැඳවන ලදී. ඉහත සඳහන් දෙවන කරුණු සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශවය සාක්ෂි මෙහෙයවීමක් හෝ වෙනයම් ආකාරයකින් කරුණු ඉදිරිපත් කිරීමක් සිදු නොකරන ලදී. වැටුප් හා දීමනාවලට අදළ ඉල්ලීමක් ඇල්පිටිය සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත යොමුකර ඇති බවත්, ඒ පිළිබඳව පරීක්ෂණයක් කර නියෝගයක් කර ඇති බවත්, රැකඩහේන සමාගමේ ස්ථාවරය විය. ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂිකරුවෙකු වන ඒ. වී. ආදිහෙට්ටි සිය සාක්ෂියේදී ඒ බව පිළිගත්තේය.

මෙම නඩුවේ විභාගය අවසන් කිරීමෙන් පසු ඉල්ලුම්කාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයේ ද සඳහන් කර ඇත්තේ ''ඉල්ලුම්කාර ඒ. ඒ. සරත් කුමාර වැව්ලි සමාගම විසින් සේවයෙන් පහකර ඇති බවත්, එයට එරෙහිව ඔහු එල්.ටී/08/739/2013 නඩුව කම්කරු උසාවියේ පවරා ඇති බවත් ය. එකී සේවකයා නීතියේ පිහිට පතා ඇති හෙයින් කාර්මික අධිකරණයට ඒ පිළිබඳව ගැටලුවක් පැන නොනගිනු ඇත.'' යනුවෙනි. එසේම ''අනෙක් ඉල්ලුම්කරු වන ඒ. වී. ආදිහෙට්ටිද සේවයෙන් පහකර ඇති බවත්, එයට එරෙහිව ඔහු එල්.ටී/04/126/2014 යටතේ කම්කරු අධිකරණය ඉදිරියේ නීතියේ පිහිට පතා ඇති අතර ඒ නඩුව දනට විභාග වෙමින් පවතී. එහෙයින් එකී සේවකයා පිළිබඳ ගැටලුවක් මතු නොවනු ඇත.'' යනුවෙන් එම ලිඛිත දේශනයේ සඳහන් කර ඇත. අනෙක් ඉල්ලුම්කරු වන එම්. ඩබ්ලිව්. කේ. රංජිත් සුමනසිරි සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශවයේ ලිඛිත දේශනයේ සඳහන් කර ඇත්තේ මෙසේ ය.

''ඉහත දෙදෙනාට අමතරව ඉල්ලුම්කාර එම්. ඩබ්ලිව්. කේ. රංජිත් සුමනසිරි යන අයටද නිර්මාණාත්මකව ක්‍රමිකව සේවයෙන් පහ කිරීමට කටයුතු කර ඇති හෙයින්, ඔහුද යථා කාලයේ දී කම්කරු අධිකරණයට ඉල්ලුම්පතක් ඉදිරිපත් කරනු ඇත. මෙතෙක් කාලය මාස හතරක් පමණ වන හෙයින් නියමිත කාලයේදී ඔහු අධිකරණය වෙත යනු ඇත. එම තත්වය යටතේ ඔහු පිළිබඳව අධිකරණයට ගැටලුවක් පැන නොනගී ''යනුවෙනි.

ඉල්ලුම්කාර ලංකා වතු සේවා සංගමයේ සාමාජිකයින් වන ඒ. වී. ආදිහෙට්ටි, ඒ. ඒ. සරත් කුමාර, එම්. ඩබ්ලිව්. කේ. රංජිත් සුමනසිරි යන අයගේ වැටුප් හා දීමනා සම්බන්ධයෙන් සාක්ෂි හා ලේඛන ඉදිරිපත් නොකළ නිසා ද, ඉල්ලුම්කාර පාර්ශවය විසින් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති ලිඛිත සැලකිරීම් වල ඔවුන් තිදෙනා ගැන ඉහත ආකාරයට කරුණු ඉදිරිපත් කර ඇති නිසාද ඔවුන්ගේ වැටුප් හා දීමනා සම්බන්ධ කිසිදු නියෝගයක් නොකරමි.

ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් කැඳවන ලද සාක්ෂිකරුවන්ගෙන් මූලික සාක්ෂි මෙහෙයවන ලද්දේ වෛද්‍යාධාර නතර කිරීමට අදළවය. මෙම නඩුවේ සාක්ෂි වලින් හෙළිදරව් වූයේ රැකඩහේන තේ කම්හලේ හා වතුයායේ සේවකයින් තුන්සීයයක පමණ සේවය කරන බවයි. එකී වෛද්‍යාධාර වෙනුවෙන් සේවකයින්ගේ වැටුපෙන් 5% ද අඩුකර සමාගම විසින් 10%ක මුදලක් යොදවා අරමුදලක් පිහිටුවා තිබී ඇති අතර, සේවකයෙකු හෝ ඔහුගේ යැපෙන්නෙකු අසරණ වී ප්‍රතිකාර ලබා ඊට අදළ රිසිට්පත් ඉදිරිපත් කළවිට පාලන අධිකාරිය විසින් ඊට අදළ මුදල ගෙවා ඇත. එම ක්‍රමය යටතේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා මුදල් ගෙවීමේදී යම් යම් අක්‍රමිකතාවයක් සිදුවූ නිසා වෛද්‍ය ආධාර ලබාදීමේ ක්‍රමයේ වෙනසක් සිදු කර නව වෛද්‍යාධාර ක්‍රමයක් හඳුන්වා දෙන ලද බවට රැකඩහේන වැව්ලි සමාගම වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන ලදී.

වතු සමාගම ප්‍රකාශ කරන ආකාරයට නව ක්‍රමය පිළිබඳ සේවකයින් දැනුවත්වීම සඳහා දැන්වීමක් (R1) ස්ථාන කිහිපයක ප්‍රදර්ශනය කර ඇත. නඩු විභාගයේදී සාක්ෂි දුන් අනුර වසන්ත ආදහෙට්ටි ද, සරත් කුමාර ද ප්‍රකාශ කර සිටියේ එවැනි දැන්වීමක් ඔවුන් නොදුටු බවයි. වතු සමාගම නඩු විභාගයේ දී ඉදිරිපත් කළ ලේඛණ වලින් තහවුරු වන්නේ, අමිල ජයරත්න නමැති වෛද්‍යවරයා 2010 වසරේ සිට වතු යායේ සහ කම්හලේ සේවකයින්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාදෙන බවයි. එවැනි වෛද්‍යාධාර ක්‍රමයක් පවතින බව නොදන්නේ යැයි ඉල්ලුම්කාර පක්ෂයේ සාක්ෂිකරුවන් කරන ප්‍රකාශ කිසිසේත් පිළිගත නොහැක. වැව්ලි සමාගම නඩු විභායේදී ලකුණු කර ඉදිරිපත් කරන ලද,

| | | |
|---|---|---|
| R 3 | - | බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කර ඇති ස්ථානය දැක්වෙන ඡායාරූපය |
| R 4 | - | වෛද්‍ය අමිල ජයරත්න මහතා විසින් වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට අදළව පවත්වාගෙන යන ලේඛනය |
| R 5, R 5A | - | වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම වෙනුවෙන් වෛද්‍ය අමිල ජයරත්න මහතාට ගෙවන ලද දීමනාවට අදළ රිසිට්පත්. |
| R 6, R 6A | - | වතු සමාගම විසින් හෙදියන්ට මුදල් ගෙවන ලද බව දැක්වෙන රිසිට්පත. |
| R 7 | - | වතු සමාගම නාගොඩ විතාන පාමසියෙන් බෙහෙත් ද්‍රව්‍ය ලබාගත් බව දැක්වෙන රිසිට්පත්. |
| R 8 | - | වෛද්‍ය අමිල ජයරත්න මහතාගෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත් බවට අත්සන් ලබාගත් ලේඛනය. |

යන ලේඛන වලින් වතු සමාගම සේවකයන් සඳහා වෛද්‍යාධාර ක්‍රමයක් පවත්වාගෙන යන බව තහවුරු වේ. වතු සේවා සංගමයේ සාක්ෂිකරුවන් ප්‍රකාශ කලේ කාර්යාලයේ සේවය කල දහත් දෙදෙනකුට වෛද්‍යාධාර අහිමිවී ඇති බවයි. එකී කාර්යාලයේ විවිධ තරාතිරම් වල සේවකයින් සේවය කරනු ලබන බව පැහැදිලි ය. සාක්ෂි දුන් සේවකයින් තිදෙනා ද, එකී දහත් දෙනාට අයත් පිරිසකි. ඔවුනට ද නව වෛද්‍යාධාර ක්‍රමය යටතේ ප්‍රතිකාර ලබා ගැනීමට බාධාවක් තිබෙන බවක් නොපෙනේ. සාක්ෂිදුන් සේවකයින් පිළිගත් කරුණක් වූයේ ඔවුන්ගේ වැටුපෙන් වෛද්‍යාධාර සඳහා අඩුකර ගත් 5%ක මුදල 2010 පෙබරවාරි මස සිට අඩුකර නොගන්නා බවයි. ඒ අනුව නව වෛද්‍යාධාර ක්‍රමය වතු සමාගමේ වියදමින්ම පවත්වාගෙන යන කටයුත්තක් බවයි.

පෙර පැවති වෛද්‍යාධාර ක්‍රමය නැවත ආරම්භ කලත්, එය බුක්ති විඳීමට කිසිවෙකු නොමැති බවට වතු සමාගම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති කරුණ කෙරෙහි ද අවධානය යොමු කරමි. ඉල්ලුම්කාර පාර්ශවය සිය ලිඛිත දේශනයේ සඳහන් කර ඇත්තේ මෙම නඩුවට සාක්ෂි දුන් ඒ. ඒ. සරත් කුමාර, ඒ. වී. ආදිහෙට්ටි යන සේවකයින් දෙදෙනා සමාගම විසින් සේවයෙන් පහ කිරීම නිසා ඊට එරෙහිව කම්කරු උසාවියේ නඩු පවරා ඇති බවයි. ඉතිරි සාක්ෂිකරු වන එම්. ඩබ්ලිව්. රංජිත් සුමනසිරි, ක්‍රමිකව සේවයෙන් පහ කිරීමට කටයුතු කර ඇති නිසා ඒ සම්බන්ධයෙන් ද කම්කරු උසාවියට කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවයි. වෛද්‍යාධාර ක්‍රමය නතර කිරීම නිසා තමන්ට ආසාධාරණයක් හා අයුක්තියක් සිදුවූ බවට සාක්ෂි මගින් හෝ ලේඛන මගින් කරුණු සනාථ කර නොමැත. එම පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ ඒ පිළිබඳව ප්‍රමාණවත් ලෙස කරුණු ඉදිරිපත් කර නොමැත. එසේම නඩු විභාගයේදී ඉල්ලුම්කාර පාර්ශවය විසින් ලකුණ කරන ලද කිසිදු ලේඛනයක් ලිඛිත සැල කිරීම සමග ගොනු කිරීමටද පියවර ගෙන නොමැත. අඩු තරමින් සාක්ෂි දුන් සේවකයින් තිදෙනා ඉල්ලුම්කාර ලංකා වතු සේවා සංගමයේ සාමාජිකයන් බවද සනාථ වූයේ නැත. ඉහත කරුණු සියල්ල සලකා බලා ලංකා වතුසේවා සංගමයේ ඉල්ලීමට අදාළව කිසිදු ප්‍රදණයක් ලබාදීම ප්‍රතික්ෂේප කරමි.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2015 සැප්තැම්බර් මස 21 වැනි දින.

12-938